# තරණය

ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය 2026 - පළමු කලාපය

## නව වසරේ ආරම්භය

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛන 34/2025 අනුව 2026 නව වසරේ වැඩ ඇරඹීම ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ බොරැල්ල හා පිළිමතලාව පුහුණු මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ හා නියෝජ්‍ය අධ්‍යක්ෂතුමියගේ ප්‍රධානත්වයෙන් 2026.01.01 දින සිදු විය. මෙහිදි ආයතන පරිශ්‍රය තුළ ජාතික ධජය ඔසවා, කිරි ඉතිරවීම හා රාජ්‍ය ප්‍රතිඥාව කියවීම හා මහා සංඝරත්නය විසින් ආයතන කාර්යය මණ්ඩලයටත්, රට වැසියන්ටත් සෙත් පතා පිරිත් සජ්ඣායනාවක් ද සිදු කරන ලදී.










# ප්‍රජාශක්ති ජාතික ව්‍යාපාරය

ප්‍රජාශක්ති ජාතික ව්‍යාපාරය සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීමේ වැඩමුළුවක් 2026.02.26 වන දින ප්‍රජාශක්ති ලේකම් කාර්යාලයේදී ජනාධිපති ජ්‍යෙෂ්ඨ අතිරේක ලේකම් කපිල ගුණරත්න මහතාගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදී.





ජාතික සමාජ සංවර්ධන ආයතනයේ (NISD) දමිළ මාධ්‍යය සිසුන් සඳහා රජය විසින් ක්‍රියාත්මක කරනු ලබන ප්‍රජාශක්ති වැඩසටහන පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් 2026.01.05 වන දින ජාතික සමාජ සංවර්ධන ආයතනයේදී පවත්වන ලදී. මෙම ආයතනය ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන සමාජ වැඩ පිළිබඳ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අනුමත උපාධි පිරිනමන ආයතනයකි. මේ සඳහා සම්පත් දායකත්වය නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම්) එච්.එම්.එම්.රුවයිත් මහතා විසින් ලබා දෙන ලදී. මේ සඳහා සිසුන් 200කට වැඩි පිරිසක් ක්‍රියාකාරීව සහභාගී වන ලදී.





## ප්‍රජාශක්ති ජාතික ව්‍යාපාරයට අදාළ ප්‍රජා සංවර්ධන නියෝජිතයින් දැනුවත් කිරීම දිවයින පුරා............

### බස්නාහිර පළාතට ...............

දිළිදුකම තුරන් කිරිමේ ජාතික ව්‍යාපාරයක් වන ප්‍රජාශක්ති වැඩසටහන සඳහා ග්‍රාම නිලධාරී වසම් තුළ පිහිටුවා ඇති ප්‍රජා සංවර්ධන සභාවන් නියෝජනය කරන සභාපතිවරුන් හා ලේකම්වරුන් දැනුවත් කිරිමේ දීප ව්‍යාප්ත වැඩසටහනක් ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය හා ප්‍රජශක්ති  ජාතික මහ ලේකම් කාර්යාලය ඒකාබද්ධව ක්‍රියාක්මක වේ. මෙයට අදාළ සමාරම්භක වැඩසටහන 2026.01.13 වන දින ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශයේ අමාත්‍ය ගරු උපාලි පන්නිලගේ මහතාගේ ප්‍රධානත්වයෙන් කොළඹ, කළුතර හා ගම්පහ දිස්ත්‍රික්ක නියෝජනය කරමින් බස්නාහිර පළාතේ දිස්ත්‍රික් ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම්වරුන්, ක්‍රමසම්පාදන අධ්‍යක්ෂවරුන්, දිස්ත්‍රික් සම්බන්ධිකරණ කමිටු සභාපතිවරුන්, ප්‍රජා සංවර්ධන සභාවල සභාපතිවරුන් සහ ලේකම්වරුන් 5000ක ගේ සහභාගිත්වයෙන් අරලියගහ මන්දිරයේදී පවත්වන ලදී.

මෙම අවස්ථාව සඳහා ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශ ලේකම් සම්පත් මන්ත්‍රිනායක මහතා, ජනාධිපති ජ්‍යොෂ්ඨ අතිරේක ලේකම් කපිල ගුණරත්න මහතා, ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශයේ අතිරේක ලේකම් මේනක හේරත් මහතා, ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂ තිලිණි සුරංගිකා කරස්නාගොඩ මහත්මිය හා පිළිමතලාව පුහුණු මධ්‍යස්ථානයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ඩබ්.කේ.එන්.එන්.කෞශල්‍යා මහත්මිය ද සහභාගි වන ලදී.







## අම්පාර දිස්ත්‍රික්කයට...............

ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය හා ප්‍රජාශක්ති ජාතික මහ ලේකම් කාර්යාලය ඒකාබද්ධව 2026.02.12 වන දින අග්නිදිග ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල ශ්‍රවණාගාරයේදී අම්පාර දිස්ත්‍රික් ප්‍රජා සංවර්ධන සභා නියෝජිතයින් දැනුවත් කිරිමේ වැඩමුළුවක් පවත්වන ලදී.

ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ(සැලසුම්) එච්.එම්.එම්.රුවයිත් මහතා විසින් සම්පත් දායකත්වය ලබා දුන් අතර එහිදි අම්පාර දිස්ත්‍රික්කයේ සියලුම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස යටතේ ග්‍රාම නිලධාරී කොට්ඨාසවල පිහිටුවා ඇති ප්‍රජා සංවර්ධන සභා නායකයින්ගේ සහ ලේකම්වරුන්ගේ භූමිකාව හා වගකීම් පිළිබඳ පැහැදිළි කරන ලදී.

මෙම අවස්ථාව සඳහා ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශයේ නියෝජ්‍ය අමාත්‍ය වසන්ත පියතිස්ස මහතා, අම්පාර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු අඩම්පාව මහතා සහ ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශයේ ලේකම් සම්පත් මන්ත්‍රිනායක මහතා, ජනාධිපති ජ්‍යෙෂ්ඨ අතිරේක ලේකම් කපිල ගුණරත්න මහතා, ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශයේ අතිරේක ලේකම් මේනක හේරත් මහතා හා අම්පාර දිස්ත්‍රික් ලේකම් ඇතුළු නිලධාරින් ද සහභාගි වන ලදී.








## පුහුණුකරු පුහුණු මධ්‍යම, සබරගමුව, උතුරු මැද , බස්නාහිර, නැගෙනහිර , දකුණ, වයඹ, ඌව පළාත් පුරා ..........

ප්‍රජාශක්ති ජාතික ව්‍යාපාරයට අදාළව පුහුණුකරුවන් පුහුණු කිරිමේ වැඩසටහනක් 2026.03.19 වන දින පිළිමතලාව ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේදි පවත්වන ලදි. ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාශයේ අතිරේක ලේකම් මේනක හේරත් මහතාගේ මුලිකත්වයෙන් පැවති මෙම පුහුණුව සඳහා ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂ තිලිණි සුරංගිකා කරස්නාගොඩ මහත්මිය හා නියෝජ්‍ය අධ්‍යක්ෂ ඩබ්.කේ.එන්.එන්.කෞශල්‍යා මහත්මිය හා ප්‍රජාශක්ති වැඩසටහනට අදාළ දිස්ත්‍රික්ක 21 ක පුහුණුකරුවන් ලෙස තෝරාගන්නා ලද නිලධාරින් මෙම පුහුණුව සඳහා සහභාගි විය. පුහුණුව සඳහා සම්පත් දායකත්වය හිටපු අමාත්‍යාංශ ලේකම් සුජාන් නානායක්කාර මහතා සහ ග්‍රාමීය සංවර්ධන කාර්යාංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ චන්දන විජේවර්ධන මහතා විසින් ලබා දෙන ලදී.














## ආයතනයේ ඵලදායිතාවය හා කාර්යක්ෂමතාවය ප්‍රවර්ධනය කිරීම උදෙසා .........

2026.01.08 වන දින පිළිමතලාව ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ඩබ්.කේ.එන්.එන්.කෞශල්‍යා මහත්මියගේ මූලිකත්වයෙන් ආයතනයේ ඵලදායිතාවය හා කාර්යක්ෂමතාවය ප්‍රවර්ධනය කිරීම උදෙසා දැනුවත් කිරීමේ වැඩසටහනක් පිළිමතලාව පුහුණු මධ්‍යස්ථානයේද පවත්වන ලදී. යටිනුවර ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ ඵලදායිතා නිලධාරී ඩී.පී.සී.එන්.ගුණසිංහ මහත්මිය සහ ඵලදායිතා නිලධාරී ජී.සී.ඩී.අමුණුපුර මහත්මිය විසින් පුහුණුව සඳහා සම්පත් දායකත්වය ලබා දෙන ලදී. පුහුණුව සම්බන්ධීකරණය සංවර්ධන නිලධාරී මල්ෂානී ආනන්ද මෙනවිය විසින් සිදු කළ අතර පුහුණුව සඳහා පිළිමතලාව කාර්යය මණ්ඩල නිලධාරින් සහභාගි වන ලදී.






ආයතනයේ නිලධාරින්ගේ රාජකාරි කටයුතු කාර්යක්ෂමව හා ඵලදායිව ඉටු කිරීම උදෙසා AI තාක්ෂණය භාවිත කළ හැකි ආකාරය පිළිබඳව පුහුණුවක් 2026.02.11 වන දින බොරුල්ල පුහුණු මධ්‍යස්ථානයේදි පවත්වන ලදී. මේ සඳහා සම්පත් දායකත්වය ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂ තිලිණි සුරංගිකා කරස්නාගොඩ මහත්මිය විසින් ලබා දෙන ලදී.



## කාර්යක්ෂම ප්‍රසම්පාදන කළමනාකරණය සඳහා නිලධාරීන් සන්නද්ධ වෙයි............

ආයතනයේ නිලධාරින් සඳහා ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් දැනුවත් කිරිමේ වැඩසටහනක් 2026.02.21 වන දින ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂ තිලිණි සුරංගිකා කරස්නාගොඩ මහත්මියගේ මුලිකත්වයෙන් පවත්වන ලදි. පුහුණුව සඳහා සම්පත් දායකත්වය ප්‍රසම්පාදන කොමිෂන් සභාවේ ගණකාධිකාරි මර්ල් මහතා විසින් ලබා දුන් අතර පුහුණුව සඳහා බොරැල්ල හා පිළිමතලාවේ කාර්යය මණ්ඩල නිලධාරින් සහභාගි වන ලදී.









## දිට්වා සුළි කුණාටුවෙන් විපතට පත් පවුල් සමාජ ආර්ථික වශයෙන් සවිබලගැන්වීම උදෙසා ...............

### මානසික උපදේශනය ..................

2026.03.24 වන දින අරණායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් දෙයියන්වල වසමට අදාළව දිට්වා සුළි කුණාටුවෙන් විපතට පත් පවුල් සමාජ හා ආර්ථික වශයෙන් සවිබලගැන්විම උදෙසා මානසික උපදේශනය පිළිබඳ වැඩමුළුවක් හොරේවල රජමහ විහාරස්ථානයේ රැස්විම් ශාලාවේදී පවත්වන ලදී. ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්විම් අමාත්‍යාංශයේ උපදේශන නිලධාරී ආචාර්යය සුසන්ත බණ්ඩාර මහතා විසින් පුහුණුව සඳහා සම්පත් දායකත්වය ලබා දෙන ලදී.





### ආතති හා හැගීම් කළමනාකරණය ...............

අරණායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් දෙයියන්වල වසමට අදාළව දිට්වා සුළි කුණාටුවෙන් විපතට පත් පවුල් සමාජ හා ආර්ථික වශයෙන් සවිබලගැන්විම උදෙසා ආතති හා හැගීම් කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩමුළුවක් 2026.03.31 වන දින හොරේවල රජමහ විහාරස්ථානයේ රැස්විම් ශාලාවේදී පවත්වන ලදී. මේ සඳහා සම්පත් දායකත්වය ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්විම් අමාත්‍යාංශයේ උපදේශන නිලධාරී ආචාර්යය සුසන්ත බණ්ඩාර මහතා විසින් ලබා දෙන ලදී.





**උපදේශකත්වය**

තිලිණි සුරංගිකා කරස්නාගොඩ

අධ්‍යක්ෂ

ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය

ඩබ්.කේ.එන්.එන්.කෞශල්‍යා

නියෝජ්‍ය අධ්‍යක්ෂ

ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය

එච්.එම්.එම්.රුවයිත්

නියෝජ්‍ය අධ්‍යක්ෂ(සැලසුම්)

ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය

**සංස්කාරක**

එච්.එම්.ජී.කේ.නවරත්න

සංවර්ධන නිලධාරී

ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය

## අපෙන් ඔබට.....

- පුහුණු වැඩසටහන්
- දේශනශාලා පහසුකම්
- ශ්‍රවණාගාර පහසුකම්
- නේවාසිකාගාර පහසුකම්
- භෝජනාගාර පහසුකම්
- පුස්තකාල පහසුකම්
- මනරම් පරිසරය









